# අමුණුවල විහාරස්ථානය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**පී. ජී. කෞෂල්‍යා දිලානි පෙරේරා**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
skysupun@yahoo.com

---

අමුණුවල විහාරස්ථානය වර්තමානය වනතුරුම සංරක්ෂණයකට භාජනය නොවුණ මහනුවර යුගයට අයත් ක්ෂේත්‍රයකි. මෙම විහාරස්ථානය මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ කහවත්ත උතුරු වසමේ මෙම පන්සල පිහිටා තිබේ. ලෙන් සිතුවම්, මැටියෙන් නිමකරන ලද ඉපැරණි කොත, ක්‍රි. පූ. 3 වන සියවසට අයත් ලෙන් ලිපිය, මහනුවර යුගයට අයත් සෙල්ලිපිය සහ වළගම්බා රජු විසින් ඉදිකළා යැයි විශ්වාස කරන ඉපැරණි අමුණ යන සාධකයන් මෙම විහාරස්ථානයට වැදගත්කමක් එක්කර තිබේ.

මෙවැනි විශේෂතා ගණනාවක් පවතින මෙම පන්සල පිළිබඳව තවමත් බලධාරීන්ගේ අවධානය යොමුව නොමැති හෙයින් එහි උරුමයන් ලෙස විනාශ පත්වෙමින් තිබේ. එහෙයින් එවැනි තත්ත්වයත් යටතේ විහාරස්ථානයෙහි වැදගත්කම පුරාවිද්‍යාත්මකව ඉස්මතු කිරීම තුළින් විනාශය තරමක් දුරට හෝ වළක්වාගැනීම මුඛ්‍ය අරමුණ කොටගෙන පර්යේෂණය සිදුකරනු ලැබිණි. මෙහි දී භාවිත කරන ලද ක්‍රමවේදය වූයේ ක්ෂේත්‍ර ගවේෂණය ය. විහාරස්ථානයේ සිට මීටර් හාරසියයක කලාපයක් ගවේෂණයට ලක්කරමින් පවතියි.

ප්‍රමුඛ පද : අමුණුවල විහාරස්ථානය, ක්ෂේත්‍ර ගවේෂණය